# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2025
# සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය : ..................................................................................................................................

| 06 ශ්‍රේණිය | I සහ II පත්‍රය | කාලය : පැය දෙක යි. |
|---|---|---|

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- I සහ II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

**• එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අදහස ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.**

**(01)** නන්දිරිස්ට දුන් ඡන්දය **<u>ගඟට ඉනි කැපීමක්</u>** වුණා දෝ යි සිතා ගැමියෝ කම්පා වූහ.

(1) නිෂ්ඵල දෙයක්　　(2) ඉතා අපහසු දෙයක්
(3) ලජ්ජාසහගත දෙයක්　　(4) ප්‍රයෝජනවත් දෙයක්

**(02)** මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝටලයේ මුළුතැන්ගෙය පරීක්ෂා කළ විට මුදලාලිට **<u>තරු පෙනුණි.</u>**

(1) දවල් තාරකා දුටුවේ ය.　　(2) කලබලයට පත් විය.
(3) අපහසුතාවට ලක් විය.　　(4) හදිසි බියක් ඇති විය.

**• අංක 03 සහ 04 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය තෝරන්න.**

**(03)** ශ්‍රී ලංකාවේ .................................. වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය.

(1) ප්‍රධානතම　(2) විශිෂ්ටතම　(3) විශාලතම　(4) අප්‍රධානතම

**(04)** "මහණෙනි, මේ බට දඬු සිදුරු වීම මාගේ පුරාතන .............................." යි බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

(1) කල්පාවෙකැ　(2) ආශීර්වාදයෙකැ　(3) අධිෂ්ඨානයෙකැ　(4) විශ්වාසයෙකැ

**(05)** නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පද යුගලය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ප්‍රමුඛ - ලේඛම්　　(2) ලාංඡනය - දක්ශිණ
(3) ප්‍රස්තාව - සම්ප්‍රධාය　　(4) සම්මුඛ - විශ්වය

**(06)** මහාප්‍රාණ අක්ෂර යෙදී **නොමැති** පදය සහිත පිළිතුර තෝරන්න.

(1) ආරූඪ　(2) පීඨය　(3) එළුවා　(4) ප්‍රධාන

**(07)** හල් කිරීමට **නොහැකි** අකුරක් සහිත වචනය තෝරන්න.

(1) කඹය　(2) සකල　(3) ධවල　(4) පාෂාණ

**(08)** පහත දැක්වෙන පදයේ ස්වර සහ ව්‍යඤ්ජන නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.

**කුරුල්ලා**

(1) කු+ර්+උ+ල්+අ+ල්+ආ　　(2) ක්+උ+ර්+ල්+ලා
(3) කු+රු+ල්+ල්+ආ　　(4) ක්+උ+ර්+උ+ල්+ල්+ආ

**• අංක 09 සහ 10 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

**(09)** ශිෂ්‍යයෝ සිංහල භාෂා තරග සඳහා සූදානම් ..................................

(1) වූවා ය.　(2) වූයේ ය.　(3) වූහ.　(4) වූයෙහි.

**(10)** .................................. ඈත අහසේ පියාසර කරති.

(1) කුරුල්ලා　(2) කුරුල්ලන්　(3) පක්ෂීහු　(4) පක්ෂීන්

**(11)** මධ්‍යම පුරුෂ, අතීත කාල, ඒක වචන ආඛ්‍යාතය තෝරන්න.

(1) කරති. (2) කරයි. (3) කළෝ ය. (4) කළෙහි.

**(12)** ඉරි ඇඳි පදවලට ගැළපෙන සමානාර්ථ පද පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

"කුඩම්මා සුරංගනාවගේ **<u>කොණ්ඩය</u>** කපා දැමූ බැවින් ඕ මහත් සේ **<u>කම්පාවට</u>** පත් වූවා ය.

(1) ගෙල, සොම්නසට (2) වරලස, දොම්නසට

(3) කෙස්ස, නින්දාවට (4) වරල, උනන්දුවට

**(13)** විරුද්ධාර්ථවත් පද යුගලය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ආගන්තුක - නේවාසික (2) විවිධ - සංකීර්ණ

(3) උණුසුම - රස්නය (4) ආරම්භය - ප්‍රාරම්භය

**(14)** පහත සඳහන් පදවලට ගැළපෙන පුරුෂ ලිංග පද පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

- කැවිඩිය
- කෙණෙර
- බාලිකාව
- බැමිණිය

(1) කෙවිලිය, ඇතා, පාලකයා, බකමූණා (2) කපුටා, ඇතින්න, බාලයා, බමුණිය

(3) කවුඩා, අලියා, බාලකයා, බමුණා (4) කොහා, මොනරා, පාලිකාව, බකුස්සා

**(15)** පහත සඳහන් ගී පද පේළියේ ඇතුළත් සඤ්ඤක අක්ෂර ගණන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

"බොඳ මීදුම් කඳුරැල්ලේ - සුරංගනා රජ දහනේ
ඔබේ සිනා කඳුළු බිඳක් - හෙටත් වාසනා"

(1) 2කි. (2) 3කි. (3) 4කි. (4) 5කි.

**(16)** අර්ථය නිවැරදි ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) සුසුදු - උසස් (2) ජඹුර -වළ

(3) පුෂ්කරණිය - පොකුණ (4) තියුණු - මහත්

**(17)** "පිපී ගියා වූ ගන මූකලන් කැලේ
මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙතී
නෙලුම් කුමාරීට කියන්නවුන් වගේ
විලේ පියාඹත් බමරෝ රුරුං ගගා" - මෙම කවිය ඇතුළත් පැදි පෙළෙහි කතුවරයා වන්නේ,

(1) ඇස්. මහින්ද හිමි ය. (2) මහගම සේකර ය.

(3) මාර්ටින් වික්‍රමසිංහ ය. (4) කුමාරතුංග මුනිදාස ය.

**(18)** පහත සඳහන් ගී පද පේළි අතුරෙන් උපමාවක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) රන් හිරු මඬලින් සිසිලස අයදිනවා (2) ඕලු පිපීලා වෙල ලෙළ දෙනවා

(3) පාසල් යන්නේ දෙව් ලොව මෙන්නේ (4) පැන මඩ කඩිති වැව් තාවලු වැහි කාලේ

**(19)** කුමාරතුංග මුනිදාස සූරීන් විසින් රචිත ග්‍රන්ථයක් **නො වන්නේ**,

(1) හීන්සැරය යි. (2) මඟුල්කෑම යි. (3) හත්පණ යි. (4) සිරිත් මල්දම යි.

**(20)** නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සිංහල අක්ෂර මාලාවේ තනිව ශබ්ද කළ නො හැකි වන්නේ, ව්‍යඤ්ජන අක්ෂර යි.

(2) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් "ඎ" සහ "ඏ" අක්ෂර දැනට භාවිතයේ නැත.

(3) "ජන කතා" සහ "ජන කවි" ජනශ්‍රැති සාහිත්‍යයට අයත් නො වේ.

(4) "බැලූහ." යන්න මධ්‍යම පුරුෂ, බහු වචන ආඛ්‍යාතයකි.

(ලකුණු 02 x 20 = 40යි.)

## II - පත්‍රය

● 01 හා 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

**(01)** පන්ති කාමරයේ දී ඔබ විසින් සිදු කරන ලද **"කථන ඇගයීම"** ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) ඔබගේ කථාව කුමන මාතෘකාවක් යටතේ සිදු කරන ලද්දේ ද ? (ලකුණු 02යි.)

(ii) මෙම ඇගයීම ඉදිරිපත් කිරීම සඳහා ගුරුතුමිය / ගුරුතුමා ලබා දුන් උපදෙස් **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

(iii) ඔබ ඉදිරිපත් කළ කථාවට අදාළව කරුණු සොයා ගත් ක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(iv) කථාවක් පැවැත්වීමේ දී ඔබ විසින් සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(v) මෙම ඇගයීම ඉදිරිපත් කිරීමේ දී ඔබ මුහුණ පෑ ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(vi) කථන ඇගයීම සිදු කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

(මුළු ලකුණු 16යි.)

**(02)** පහත දැක්වෙන මාතෘකාවලින් **එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු** රචනයක් ලියන්න.

(i) ජන කවිය යි - ගැමි දිවිය යි

(ii) ජල සම්පත ආරක්ෂා කර ගනිමු.

(iii) මා සිත් ගත් ලේඛකයා

(iv) පොත් කියවන්නෝ - ලොව දිනන්නෝ ය.

(v) ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනයා

(ලකුණු 14යි.)

**(03)** රැකියාවෙන් විශ්‍රාම යන ඔබේ පාසලේ විදුහල්පතිතුමාට, එතුමන් විසින් සිදු කරන ලද සේවය අගය කරමින් **සුබ පැතුම් පතක්** සකසන්න.

**නැතහොත්**

සමස්ත ලංකා චෙස් තරගාවලියෙන් ප්‍රථම ස්ථානය දිනා ගත් ඔබේ මිතුරාට / මිතුරියට සතුට ප්‍රකාශ කරමින් **පෞද්ගලික ලිපියක්** ලියන්න.

(ලකුණු 10යි.)

**(04)** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) පහත දැක්වෙන අක්ෂර යෙදුණු වචනය බැගින් ලියන්න.

● ඛ - ....................................................

● ඝ - ....................................................

(ii) "රැලිය" යන වචනයේ යෙදී ඇති පිල්ලම්වල නම් අනුපිළිවෙළින් ලියන්න.

(iii) පහත දැක්වෙන පද යොදා අර්ථවත් වාක්‍යයක් බැගින් නිර්මාණය කරන්න.

● වනය - ..........................................................................................................................

● වණය - ..........................................................................................................................

(iv) ඟ, ඦ, ඬ, ඳ, ඹ - යන අක්ෂර හඳුන්වන නාමය කුමක් ද ?

(v) සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර ගණන කීය ද ? එයින් **දෙකක්** ලියා දක්වන්න.

(ලකුණු 02 × 05 = 10යි.)

**(05)** පහත සඳහන් ප්‍රශ්නවලට පෙළ පොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(i) "එදා හෙළදිව" ග්‍රන්ථයේ මුල් කතුවරයා කවුරුන් ද ?

(ii) භාර්යාවගේ කෙනෙහිලිකම්වලින් බේරීමට මහා වනයට ගොස් පසුව දෙවියකු බවට පත් වූයේ කවුරුන් ද ?

(iii) "වැඩක් කර ගන්න - උදව්වට ගන්න
කෙනෙක් අර ගන්න - තමයි මම ඉන්නෙ" - මෙම ප්‍රකාශය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද ?

(iv) නිවැරදි ශබ්ද උච්චාරණය කිරීමේ හුරුව ලබා දීමට අතීතයේ භාවිතා කළ ග්‍රන්ථය කුමක් ද ?

(v) පන්සිය පනස් ජාතක පොත රචනා වුණු රාජධානි සමය කුමක් ද ?

(ලකුණු 02 × 05 = 10යි.)

**(06)** පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




- <u>හරහට</u> ☞

1. "රත්රන්" යන්නට සමානාර්ථ පදයකි.
2. රසවත් කැවිලි වර්ගයකි.
4. කුමාරතුංග මුනිදාස සූරීන් විසින් රචිත ග්‍රන්ථයකි.
7. ඒ. පී. ගුණරත්න මහතාගේ නිර්මාණයකි.

- <u>පහළට</u> ☟

1. "මැකී ගිය දඬමං" මුල් කෘතියේ කතුවරයා මෙතුමා ය.
2. "කම්මැළි" යන්නට සමානාර්ථ පදයකි.
3. ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධ ප්‍රදේශයකි.
5. ජී.බී. සේනානායක සූරීන් විසින් රචිත ග්‍රන්ථයකි.
6. "කන්" යන්නට සමානාර්ථ පදයකි.
8. ලී ඉරීම සඳහා භාවිතා කරයි.

(ලකුණු 01 × 10 = 10යි.)

**(07)** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වර්ෂ 1873 දී පැවැති "පාණදුරා වාදය" හේතු කොට ගෙන බෞද්ධ ඉගැන්වීම් ලොව පුරා ප්‍රසිද්ධ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමෙරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා හා ධනවත් සමාජ සේවිකාවක වූ බ්ලැවැට්ස්කි මැතිනිය, විද්‍යෝදය පිරිවෙනේ දී හමු වීම දොන් ඩේවිඩ් තරුණයාගේ ජීවිතයට නව ආලෝකයක් ගෙන දීමට සමත් විය. රට පුරා සංචාරය කරමින් ඕල්කට් තුමා ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වූ දේශනා දොන් ඩේවිඩ් තරුණයා සිංහලයට පරිවර්තනය කළේ වැටී ගිය ජාතිකත්වය, මැකී ගිය ආගමික හැඟීම, නැසී ගිය දේශ ප්‍රේමය යළි පණ ගන්වමිනි. එම නිසා මීට පෙර බෞද්ධයන් යැයි ප්‍රසිද්ධියේ කීමට ලජ්ජා වූ සිංහලයෝ ආත්ම ශක්තිය ප්‍රකෘතිමත් කොට නැගී සිටියහ. ඕල්කට් තුමා විසින් "සත්‍යයට වඩා උසස් ආගමක් නැත" යන්න පදනම් කර ගෙන ලෝක සහෝදරත්වය ගොඩ නැඟීමේ අදිටනින් "පරම විඥානාර්ථ බෞද්ධ සමාගම" ආරම්භ කරන ලදී.

(i) බෞද්ධ ඉගැන්වීම් ලොව පුරා පැතිර ගියේ කුමක් හේතු කොට ගෙන ද ?

(ii) මෙහි සඳහන් වන සමාජ සේවිකාවගේ නම කුමක් ද ?

(iii) මෙම ඡේදයට අනුව දොන් ඩේවිඩ් තරුණයාට පැවරුණු කාර්යය කුමක් ද ?

(iv) "පරම විඥානාර්ථ බෞද්ධ සමාගම" ආරම්භ කරන ලද්දේ කුමක් පදනම් කර ගෙන ද ?

(v) "ප්‍රචලිත", "අධිෂ්ඨානයෙන්" යන පදවලට ගැළපෙන සමානාර්ථ පදය බැගින් ඉහත ඡේදයෙන් උපුටා ලියන්න.

(ලකුණු 02 × 05 = 10යි.)